// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1991/12 - 2016 නොවැම්බර් මස 01 වැනි අඟහරුවාදා - 2016.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : අනු/3/5/3/11/1/10.

*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4/3/9/2013/WS/366.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ විස්තර :*

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 55, ඇතාකඩ ග්‍රාම නිලධාරි වසමේ ඇතාකඩ ගමේ, පිහිටි අනුරාධපුර දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් මැන සකස්කර ඇති අ.ග.පි. 627 පිඹුරේ කැබලි අංක 149 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4047ක් වූ ඇතාකඩලන්ද කැලේ නමැති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් කොටස.

*උතුරට* : කැබලි අංක 150, 290 සහ 148 ; *නැගෙනහිරට* : කැබලි අංක 148 සහ 147 ; *දකුණට* : කැබලි අංක 147 සහ 150 ; *බටහිරට* : කැබලි අංක 150.

**කැබලි අංක 149 — ඉඩමේ නම: ඇතාකඩලන්ද කැලේ; හිමිකම් කියන්නා: හඳුනාගත නොහැක.**

ඉහත සඳහන් *ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2016 නොවැම්බර් මස 16 වැනි දින පූ.භා. 10.00ට මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2016 නොවැම්බර් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී *ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. එම්. ශාන්ත දසනායක,
ප්‍රාදේශීය ලේකම්,
මැදවච්චිය.

2016 ඔක්තෝබර් මස 21 වැනි දින,
මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 752

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24470 - 17 - (2016/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.